# කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

## මෙහෙයවන විශේෂ මණ්ඩපය - සැකසූ ආහාර හා ඇසුරුම් ප්‍රදර්ශනය 2026

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය, එක්ව සාර්ථකව 23 වන වරටත් සැකසූ ආහාර හා ඇසුරුම් ප්‍රදර්ශනය (PROFOOD PRO PACK EXHIBITION) සංවිධානය කරනු ලැබේ. මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ සැකසූ ආහාර හා ඇසුරුම් ක්ෂේත්‍රය සඳහා පැවැත්වෙන ප්‍රධානතම ප්‍රදර්ශනය ලෙස පිළිගැනේ.

මෙහිදී සැකසූ ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින **ක්ෂුද්‍ර හා සුළු පරිමාණ** කර්මාන්තකරුවන් සඳහා විශේෂිත වූ ප්‍රදර්ශන කුටි 10කින් සමන්විත මණ්ඩපයක් මෙම අමාත්‍යාංශය මගින් සංවිධානය කර ඇත. **මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගි වන ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්ත සඳහා එම මණ්ඩපයේ ප්‍රදර්ශන කුටියට අදාලව නියමිත ගාස්තුවෙන් 50% ක් කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය මගින් දරනු ලැබේ.**

### ප්‍රදර්ශනය සඳහා අපේක්ෂිත කර්මාන්ත

- **සැකසූ ආහාරපාන**
  - එළවළු / පළතුරු ආශ්‍රිත ආහාර
  - කිරි නිෂ්පාදන
  - මස් / මාළු / බිත්තර නිෂ්පාදන
  - බිස්කට් නිෂ්පාදන
  - බේකරි නිෂ්පාදන
  - පොල් ආශ්‍රිත නිෂ්පාදන
  - ආහාර සඳහා යෝග්‍යතෙල් වර්ග
  - තේ (ඖෂධීය / කාබනික)
  - කුළුබඩු
  - අනෙකුත් සැකසූ ආහාරපාන
  - සෞඛ්‍යමය ආහාරපාන

### තෝරාගැනීමේ ක්‍රියා පිළිවෙල

ඉහත සඳහන් ක්ෂේත්‍රයන්හි නියැලී සිටින ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්තකරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. මේ අතරින් කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටුවක් මගින් සුදුසු කර්මාන්තකරුවන් තෝරාගනු ලැබේ.

### ඉල්ලුම් කිරීමේ ක්‍රියා පිළිවෙල

මෙම පහසුකම් ලබාගැනීම සඳහා පහත සඳහන් QR කේතය මගින් හෝ ගූගල් දිගුව මගින් අදාල අයදුම්පත සම්පූර්ණ කර 2026 අගෝස්තු මස 04 වන දින හෝ ඊදිනට ප්‍රථම යොමු කරන්න.

Profood Propack Ag-Biz Knowledge Hub 2026 (23rd Edition)

Brought to you by

SRI LANKA FOOD PROCESSORS ASSOCIATION (SLFPA)

**21 22 23**

**AUGUST 2026**

**AT BMICH EXHIBITION CENTER**

Google Link:
https://forms.gle/Dfi4vnjyaaP7AzFt7

## SME PAVILION

**2026 අගොස්තු මස 21, 22, 23 යන දිනයන් හී දී**

සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානය




ලේකම්

**කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය,**
**73/1, ගාලු පාර, කොළඹ 03.**

වැඩි විස්තර සඳහා විමසන්න: **අධ්‍යක්ෂ - සංවර්ධන අංශය**।
දුරකථන: 011-2422319
**Email -** sector1@industry.gov.lk **Web:** www.industry.gov.lk

www.profoodpropack.com